
අඛණ්ඩවම 16 වසරක් ජනප්‍රියතම මහජන සම්මානයෙන් පිදුම් ලද දිනපතා ජාතික පුවත්පත ★

# ලංකාදීප

31 වැනි කාණ්ඩය | 189 වැනි පත්‍රය | පිටු 16 යි | කොටස් 2 යි | විජය ප්‍රකාශනයක් | 2022 අප්‍රේල් මස 21 වැනිදා බ්‍රහස්පතින්දා | අන්තර්ජාල ලිපිනය - www.lankadeepa.lk | මිල රුපියල් 30.00යි

## රඹුක්කන සිද්ධියට ජනපති දැඩි ලෙස කනගාටුව පළකරයි



8 වැනි පිටුව බලන්න

## ආණ්ඩුවේ තව මන්ත්‍රී තිදෙනෙක් විපක්ෂයට



# අරගලයේ සහායට රට පුරා හර්තාල්

## පාරවල් වහලා-ධීවරයෝත් වතු කම්කරුවෝත් පාරට

රඹුක්කනදී විරෝධතාකරුවන්ට වෙඩිතැබීමේ සිද්ධියට මෙන්ම ඉන්ධන මිල ඉහළනැංවීම, ඉන්ධන හිඟය සහ ජීවන වියදම ඉහළයාම සම්බන්ධයෙන් විරෝධය පා ඊයේ (20) දිනයේදීත් රටපුරා විවිධ ප්‍රදේශවල ජනතාව විරෝධතාවන්හි යෙදුණහ.

6 වැනි පිටුවට



## කල් මරනවා විතරයි: විසඳුම් නෑ

# ජනපතිට පාර්ලිමේන්තුවට මහ නාහිමිවරුන්ගේ අප්‍රසාදය

ජනතාව මුහුණ දෙන උග්‍ර ජීවන අර්බුදය පිළිබඳව මෙන්ම රෑ දවල් දෙකෙහි අව්වැසි නොතකා පෝලිම්වල රැඳී සිටිමින් මියැදෙන ජනතාව කෙරෙහි අසංවේදීව කල් මරමින් වගකීම් විරහිතව කටයුතු කිරීම හේතුවෙන් රට වැසියන් අත්විඳින පීඩාවට රාජ්‍ය නායකයාත් පාර්ලිමේන්තුව නියෝජනය කරන මහජන නියෝජිතයන් සියලු දෙනාත් වගකිව යුතු බව ත්‍රෛනිකායික මහ නාහිමිවරු නිවේදනයක් නිකුත් කරමින් කියා සිටිති.

6 වැනි පිටුවට



## තෙල් බවුසරයට ගිනි තිබ්බා නම් අද රඹුක්කනක් නෑ

### ගිනි තියන්න හදද්දී පොලිසිය බලය යෙදුවා

(සුජිත් හේවාජුලිගේ සහ අංජුල මහික වීරරත්න)

රඹුක්කන උද්ඝෝෂණකරුවන් ඉන්ධන ලීටර් 33,000 ක් සහිත බවුසරයක් ගිනි තැබීමට සූදානම් වූ අවස්ථාවේ දී පොලිසිය තමන්ට ඇති බලතල අනුව එය නැවැත්වීමට කටයුතු කළ බවත් තෙල් බවුසරයට ගිනි තැබුවේ නම් අද රඹුක්කනක් නැති බවත් මහජන ආරක්ෂක අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පාර්ලිමේන්තුවේ දී ඊයේ (20) පැවැසීය.

6 වැනි පිටුවට




## කූඩාරම් ගසා ගාලු පාර වහලා...

පානදුර ඔරලෝසු කණුව ඉදිරිපිට ගාලු පාර අවහිර කරමින් ත්‍රිරෝද රථ රියදුරන් පිරිසක් පෙරේදා (19) දහවල් ආරම්භ කළ විරෝධතාව ඊයේ පස්වරුව වන විටත් පැවති අතර, ඔවුහු ගාලු පාර ස්ථාන තුනකින් අවහිර කරමින් විරෝධතාවේ යෙදී සිටියහ. විරෝධතාකරුවන් ගාලුපාර හරස් කර හට් ඉදිකරමින් විරෝධතාව පළ කර තිබූ අයුරු ඡායාරූපයේ දැක්වේ.

(ඡායාරූපය - පානදුර සුමිත් පොතුපිටිය)

## පොහොට්ටු මන්ත්‍රීන් 13 කගෙන් ජනපතිට තද ලිපියක්

### අන්තර්කාලීන ආණ්ඩුවක් පිහිටුවන්න: නැත්නම් තීරණයක් ගන්න වෙනවා

(අජන්ත කුමාර අගලකඩ)

රටේ මතුවී ඇති අර්බුදය විසඳීම සඳහා සියලු පක්ෂ සමග එක්ව අන්තර්කාලීන ආණ්ඩුවක් පිහිටුවන්නැයි ආණ්ඩුවේ මන්ත්‍රීවරුන් දහතුන් දෙනකු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගෙන් ඉල්ලීමක් කර ඇතැයි වාර්තා වේ.

6 වැනි පිටුවට

## රාජ්‍ය ඇමැතිවරු තව තුනක් දිවුරුම් දෙති




### පිල්ලෙයාන්ද ඒ අතර

8 වැනි පිටුව බලන්න

## අයි.එම්.එෆ් ණය කොන්දේසි ශ්‍රී ලංකා පිරිසට පහදයි

### පණ්කජ රුවින්දගේ සරදම්



අපි යෙදුවේ අවම බලය !
එතකොට අවම බලයට එක ජීවිතයද සෑර්? !

## 'ලේ එපා' ස්ටිකරයෙන් මැතිසබේ රත්වෙයි

## අපේ ආණ්ඩුවේ තුවක්කු කිසිවකුට පත්තු වුණේ නෑ



8 වැනි පිටුව බලන්න

## ගල්අඟුරු නැව් දෙක නිදහස් කරගනී

8 වැනි පිටුව බලන්න

## චමල් මැතිසබේ පසුපෙළින් ඉදිරි පෙළට







පිටරටින් එවන සල්ලිවලට
කෝටි 5කට අධික තෑගි

**BOC Smart Remit** වෙතින් පිට පිට තෑගි දිනන්න අවස්ථාව ලබාදෙන **BOC පිට පිට රට තෑගි සීසන් 3** සමග එක්වන සැමට අවුරුද්ද පුරා දිනුම් වරම් රැසක්.

| | | | |
|---|---|---|---|
| සුපිරි තෑග්ග | කෝටි 3ක් වටිනා සුපිරි නිවසක් | මාස්පතා | රන් කාසි |
| සතිපතා | රු. 100,000/- ක් වටිනා විදුලි හා ගෘහ උපකරණ තෑගි වවුචර | දිනපතා | රු. 10,000/- ක් වටිනා සුපිරි වෙළෙඳසල් තෑගි වවුචර |

ඉක්මන් කරන්න! මේ අවස්ථාව **2022 අප්‍රේල් 01 වැනිදා සිට 2023 මාර්තු 31** දක්වා පමණි.

ලංකා බැංකුවට එවනු ලබන සෘජු ප්‍රේෂණ සහ ඕනෑම ලංකා බැංකු ශාඛා කවුන්ටරයකින් ලබාගන්නා ප්‍රේෂණ මේ සඳහා සුදුසුකම් ලබයි.

කොන්දේසි සහිතයි.

ප්‍රධාන කාර්යාලය, BOC චතුරශ්‍රය, අංක 1, ලංකා බැංකු මාවත, කොළඹ 1.

ලංකා බැංකුව BOC ජාතියේ මහා පහන් ටැඹ

# අරගලය මැද රටේ නීතිය රැකීමත් ඕනෑ

ලංකාදීප

2022 අප්‍රේල් මස 21 වැනිදා බ්‍රහස්පතින්දා

අන්තර්ජාලයේ ප්‍රථම සිංහල පුවත්පත

වෙබ් අඩවි--: වෙබ්.ලංකාදීප.ලංකා- www.lankadeepa.lk

කර්තෘ මණ්ඩලය : 2448321, 2423919, 5383237 ෆැක්ස් : 2438039, 2479240, 5383240 බෙදාහැරීම් : 2479625 ෆැක්ස් : 2479650

දැන්වීම් :2479540, 5383383, 5330330, ෆැක්ස් : 2314864, 2479595

අද රටේ ඇත්තේ අර්බුදකාරී වාතාවරණයකි. පසුගිය මාස ගණනාවක් තිස්සේ සෙමෙන් සෙමෙන් වර්ධනය වූ අර්බුද පුපුරා යන්නට පටන් ගත්තේ මෑතකදීය. වත්මන් ආණ්ඩුව ප්‍රශ්න පත්‍රයකට පාර කපා ගත්තේ එක රැයෙන් රසායනික පොහොර තහනම් කිරීමෙනි. එය රටපුරා පැතිරුණ ගොවි අරගලයකට මාවත සකස් කළේය. අනතුරුව හටගත්තේ ගෑස් පිපිරිල්ලයි. එයට සමගාමීව ගෑස් හිඟයක්ද හට ගැනිණ. විදුලිය කප්පාදුව, ඉන්ධන හිඟය සහ දරාගන්නට බැරි ජීවන වියදම ජනතාව මහපාරට තල්ලු කරන ලද බව නොරහසකි. ආදායම එකතැනම තිබියදී වියදම අසීමිත ලෙස ඉහළ යාම නිසා මෙතෙක් මෙරට ක්‍රියාත්මක වූ සංවර ප්‍රජාතන්ත්‍රවාදය අසංවර හා හිතුවක්කාර ස්වභාවයක් ගත්තේය.

දැන් හටගෙන තිබෙන මෙකී ආර්ථික අවපාතයට වත්මන් රජය මෙන්ම පෙර පැවැති ආණ්ඩුද අඩු වැඩි වශයෙන් වගකිවයුතුය. පවත්නා තත්ත්වය යටතේ භාණ්ඩ සහ සේවා හිඟය මෙන්ම සියයට 18 ඉක්ම වූ විශාල උද්ධමනයකට සමාජය නතුව සිටී. පීඩනය අධික වනවිට ජනතාව නොසන්සුන්ව මහපාරේ විරෝධතාවලට එක්විය. අවසානයේ එය නොනිදන අරගලයක් බවට පත්ව තිබේ. විශේෂයෙන්ම ජංගම දුරකතන සහිත තරුණ සමාජය එක රැයින් රටේ ජනමත ප්‍රධානීන් බවට පත් විය. අද වන විට මෙම අර්බුදය මරණයකින් කෙළවර වී තිබේ. ඉස්සරහට තත්ත්වය කෙසේ වේදැයි නිර්වචනය කළ නොහැක.

ආණ්ඩුවට එරෙහිව මෙලෙස අරගල කරන තරුණ සමාජයට පිළිගත් වැඩිහිටි සමාජයෙන්ද සෑහෙන ආශීර්වාදයක් හිමිවීම විශේෂයකි. මෙම අරගලකරුවන් විසින් විවෘත කරන ලද රැඩිකල් කවුළුව තුළින් ප්‍රකට වන්නේ ජවසම්පන්න තාරුණ්‍යයේ ආවේගයය. එහෙත් හැඟීම්වලින් සහ ආවේගවලින් පමණක් මෙම අර්බුදයට විසඳුම් සෙවිය හැකිද යන ප්‍රශ්නය මෙහිදී පැන නඟී. ජනතාවට බලපාන සැබෑ ප්‍රශ්න හඳුනාගෙන ඒවා පවත්නා සම්මත නීති රාමුව තුළ විසඳ ගැනීම යෝග්‍ය ක්‍රමය බව බොහෝ විද්වතුන්ගේ මතයයි. ආණ්ඩුව වෙනස් කළ යුතු නම් එය කළ යුතුය. එහෙත් එම සංකීර්ණ කටයුත්ත සිදුකළ යුත්තේ නීතිය අතට ගැනීමෙන් නොව නීතියට අනුකූල වෙමිනි. රටේ ජනතා පරමාධිපත්‍යය ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණය යන බල කේන්ද්‍ර තුන හරහා තුලන හා සංවරණයට යටත්ව ක්‍රියාත්මක වෙයි. යුක්තිය සාධාරණය සහ මානව හිමිකම් ආදිය සම්බන්ධයෙන් එදාට වඩා අද සමාජය දැනුවත්ය. එනිසා අරගලය නිසිමග ගෙන ගොස් ජයගැනීම ජයග්‍රහණයේ කීර්තිය වඩාත් ඔප්නංවන බව සඳහන් කළ යුතුය.

ආණ්ඩු වෙනසක් කළ යුතු නම් ඒ සඳහා පිළිගත් ක්‍රමය වන්නේ මැති සබයේ විශ්වාසභංගයකින් රජය පරාජය කිරීමය. ඊට මැතිසබා බහුතරය කැමති විය යුතුය. එසේ මැතිසබා බහුතරය කැමැති නොවී වසර 2018 දී දින 52ක් ආණ්ඩු කළ මහින්ද රාජපක්ෂ රජයට සියල්ල අකුලාගෙන විපක්ෂයට යන්නට සිදුවීම මේ ගැන ලබාදිය හැකි ආසන්නතම උදාහරණයයි. යට කී ලෙස විශ්වාසභංගයකින් රජය පරාජය නොකරන්නේ නම් මැතිසබය පත්ව වසර දෙක හමාරක් යනතුරු එය විසුරුවා ලීමට ජනාධිපතිට හෝ බලයක් නැත. එහෙත් මැතිසබයේ මන්ත්‍රීන් බහුතරයක යෝජනා සම්මතයක් මගින් ජනපතිගෙන් ඉල්ලා සිටින්නේ නම් පමණක් ජනපතිවරයාට කල් තබා රජය විසුරුවා හරින්නට නීතිමය අවසරය හිමිවෙයි. එම ක්‍රමය ආණ්ඩුවක් නීත්‍යනුකූලව වෙනස් කරන්නට තිබෙන සම්මත ක්‍රමවේදයයි. එසේම ජනාධිපතිවරයා ධුරයෙන් පහ කළ යුතු නම් එයට ව්‍යවස්ථාවේ පවත්නා එකම පිළිගත් ක්‍රමය දෝෂාභියෝග යෝජනාවකි. එය දීර්ඝ නීතිමය ක්‍රියාදාමයක් හා බැඳී පවතී. මෙම තත්ත්වය තුළ පසුගියද රජය විවෘතව විපක්ෂයට ආරාධනා කළේ මැතිසබා බහුතරය පෙන්වා ආණ්ඩු බලය ලබාගන්නා ලෙසය. ඒ අනුව විපක්ෂය දැන් රජයට එරෙහිව විශ්වාසභංගයක් ගෙන ඒමට සැලසුම් කර ඇති බව වාර්තා වෙයි. ප්‍රජාතන්ත්‍රවාදයට අනුකූල නිසි පිළිවෙත එයයි.

ඒ අතර රටේ විසඳිය යුතු තවත් ප්‍රශ්න රාශියකි. ගෑස් සහ ඉන්ධන හිඟය, ඖෂධ හිඟය, විදුලිය කප්පාදුව ඉන් ප්‍රධානය. පීඩාවට පත් ජනතාව වීදිවලට කැඳවනු ලැබුයේ මෙම ප්‍රශ්න විසින් බව ප්‍රකට කරුණකි. එහෙත් දැන් ඒ ගැන මාධ්‍ය ඔස්සේ මත දක්වන්නේ ඉන්ධන හෝ ගෑස් පෝලිම්වල සිටිමින් පීඩාවට පත්වන ජනතාව පමණි. එයද බරපතළ ඌණතාවක් බව අපි දකිමු. ඒ අතරට ඉන්ධන මිල වැඩිවීමත් ඒ හේතුකොට ගෙන බස් ගාස්තු, පිටි සහ බඩු මිලත් වැඩි වී ඇත. මෙයින් මහජන කෝපය තවත් උත්සන්න වී ඇත. ගාලු මුවදොර අරගලය අතරතුර ජනතාව පීඩාවට පත්කළ මෙකී සංවේදී ප්‍රශ්න ගැනද අරගලකරුවන්ගේ සහ රජයේ අවධානය දැඩිව යොමුවිය යුතුය. එසේම දිනෙන් දින ඉහළ යන ජීවන වියදම, පාලනයකින් තොරව ඩොලරය අධිප්‍රමාණ වීම වැනි කාරණා ගැනද මෙයට සමගාමී අවධානයක් අවශ්‍ය කෙරේ.

ජනාධිපතිවරයා නව අමාත්‍ය මණ්ඩලයක් පත් කළේය. නවක මුහුණු බහුතරයකින් සමන්විත අමාත්‍ය මණ්ඩලය ගැන පළවන ප්‍රතිචාර මිශ්‍ර ස්වභාවයක් ගනී. එහි ගුණදෙස් විවේචනයට තව ටික දිනක් කල්දීම යුතුකමකි. එසේම ජනාධිපතිවරයා අමාත්‍ය මණ්ඩලය අමතා කළ කතාවේදී රසායනික පොහොර තහනම තමන් අතින් වූ වරදක් බව පිළිගත්තේ නිහතමානීවය. එසේම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යාම පමාවීම ගැනද සඳහන් කළේය. ජනපතිවරයා දැන්වත් යථාර්ථය තේරුම් ගැනීම හොඳය. එහෙත් ඔහුට යථාර්ථය වැටහෙන විට පීඩාවට පත් ජනතාව මහ පාරේය. එබැවින් ජනතාව තව තවත් පීඩාවට පත් නොකර ඔවුන්ගේ ජීවන ගැටලුවලට කඩිනම් විසඳුම් අවශ්‍යය.

---

## මතවාද

# රට ගොඩගන්න කළ යුතු දේ නොකළ යුතු දේ

**ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මහා බිල්ලකු සේ සලකමින් සිටි ආණ්ඩුව දැන් එහි පිහිට පතයි. අපේ රටේ පවතින ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒමට මුදල් ඇමැති හා මහ බැංකු අධිපති ඇතුළු පිරිසක් දැන් මූල්‍ය අරමුදල සමග සාකච්ඡා කරති. මේ ඒ පිළිබඳව විමසා බලන ලිපියකි. මෙම ලිපිය සඳහා තොරතුරු සපයන්නේ ඇඩ්වකාටා ආර්ථික පර්යේෂණායතනයේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරි ධනනාත් ප්‍රනාන්දු මහතාය. මේ ඔහුගේ විග්‍රහයයි.**

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යාමෙන් අපේ සියලු ප්‍රශ්න නොවිසඳෙයි. එහි ගිය පමණින් අපේ ආර්ථිකය දඩිබිඩියේ නොනැගිටියි. වැරදි ලෙස ආර්ථිකය කළමනාකරණය කිරීම හේතුවෙන් දැන් ලංකාව සිටින්නේ හුස්ම ගැනීමටවත් නොහැකි තත්ත්වයකය. දැන් රට තිබෙන්නේ තම ණය ගෙවා ගත නොහැකි තත්ත්වයකය. ඒ ණය ගෙවීම කල්දමාගෙන ප්‍රතිව්‍යුහගත කර ගැනීමට නම් ජාත්‍යන්තරයේ පිළිගත් ප්‍රතිරූපයක් තිබෙන පුද්ගලයකු හෝ ආයතනයක් සමග සම්බන්ධවීම අත්‍යවශ්‍යය. ඒ සඳහා ලොව පිළිගත් ප්‍රධානම ආයතනය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලය.

**ලංකාව මේ වන විට මූල්‍ය අරමුදලට 16 වතාවක් ගොස් තිබේ. ඒ එහි සාමාජිකත්වය ලබාගත් පසුවය. මෙවර අප එහි යන්නේ 17 වැනි වරටය. මූල්‍ය අරමුදල වෙත නිතර ගිය රටවල් අතර ලංකාව ද සිටියි.** ගතවූ කාලයෙන් හරි අඩක්ම ලංකාව සිටියේ මූල්‍ය අරමුදලේ වැඩ සටහන් සමගය. ඉන් අනාවරණය වන්නේ ලංකාව නිතරම තම ආර්ථිකය නිසි පරිදි කළමනාකරණය කර නැති බවය. ආර්ථිකය නිසි ලෙස කළමනාකරණය කරන්නේ නම් අපට මූල්‍ය අරමුදලට යන්නට සිදු නොවෙයි. ශරීර සෞඛ්‍ය යහපත් පුද්ගලයෝ වෛද්‍යවරුන් හමුවට නොයති. එහෙත් ශරීර සෞඛ්‍ය පිරිහුණු පුද්ගලයන්ට නිතර වෛද්‍යවරුන් හමුවීමට යන්නට සිදුවෙයි. රටක් හැටියට ලංකාව ද එවැනි රෝගියෙකි.

ශරීර සෞඛ්‍ය පිරිහුණු අවස්ථාවේ වෛද්‍යවරයකු හමුවට යා යුතුමය. නොගොස් සිටියොත් තවත් අසාධ්‍ය වෙයි. ලංකා ආර්ථිකය අද පවතින්නේ එවැනි තත්ත්වයකය. **ලංකාව මීට පෙර මූල්‍ය අරමුදලට 16 වතාවක් ගොස් ඇතත්, සම්පූර්ණ කර තිබෙන්නේ ඉන් වැඩසටහන් හයක් (6) පමණි. ගිවිසගත් වැඩසටහන් 10ක් ලංකාව විසින් සපුරා නැති බව ඉතිහාසයේ සඳහන් වෙයි.**

මූල්‍ය අරමුදලෙන් ණයක් ගැනීමට නම් අප කරන්නේ කුමන ආර්ථික ප්‍රතිසංස්කරණද කියා ඔවුන් සමග එකඟතාවකට පැමිණිය යුතුය. ඔවුන් අපට යම් මුදලක් වාරික වශයෙන් ලබා දෙන්නේ ඇතිකරගත් එකඟතා සම්පූර්ණ කරන අයුරු මතය. ඒ ණය දෙන්නේ කොටස් වශයෙන් මිස ගෙඩි පිටින් නොවේ.

අප මූල්‍ය අරමුදල සමග වැඩසටහනකට එළඹිය යුත්තේ එමගින් වෙනත් ජාත්‍යන්තර මූල්‍ය ආයතනවලින් ණය හෝ ආධාර ලබා ගැනීමට වඩාත් පහසු වන හෙයිනි. ජාත්‍යන්තරයෙන් ගන්නා ණයවලින් අප ගෙවීමට තිබෙන ජාත්‍යන්තර ණය ගෙව්වොත් රටේ ජනතාවට සහනයක් නොලැබෙයි. මූල්‍ය අරමුදල ණය ගෙවීම සඳහා ණය නොදෙයි. **මූල්‍ය අරමුදලේ විවිධ වැඩසටහන් තිබේ. මාස 36කට වඩා වැඩි කාලයක් ඇදෙන වැඩසටහන් ඒ අතරින් විශේෂිතය. දැන් ලංකාව යන්නට සැරසෙන්නේ එවැනි වැඩසටහනකටය.**

ලංකාව මීට පෙර එවැනි වැඩසටහන් හයකට මූල්‍ය අරමුදල සමග ගිවිස ගත්තත් සම්පූර්ණ කර තිබෙන්නේ වැඩසටහන් දෙකකි. අනෙක් වැඩසටහන් හතරම අතරමග නවතා තිබේ.

මූල්‍ය අරමුදල සමග ගිවිස ගන්නා දීර්ඝකාලීන වැඩසටහනකදී (Extended Fund Facility) ආර්ථික ප්‍රතිසංස්කරණ රැසක් කළ යුතුය. මේ අවස්ථාවේදීත් අප මූල්‍ය අරමුදලට යා යුත්තේ කීයක්හරි ලබාගැනීමේ බලාපොරොත්තුවෙන් නොවේ. අපේ ආර්ථිකය සම්පූර්ණයෙන්ම ප්‍රතිව්‍යුහගත කරගැනීම එහි යාමේ අරමුණ විය යුතුය.

## එකම විසඳුම අයි.එම්.එෆ් ද?

**ලංකා ආර්ථිකය නමැති නිවසේ ඉදිකිරීම් සියල්ල වැරැදිය. ඒ නිසා දැන් තීන්ත ගාලා හරියන්නේ නැත. අත්තිවාරමේ සිට සියල්ල නිවැරැදි කළ යුතුය. මේ වහලවේදීවත් වැරැදි සියල්ල නිවැරැදි කරගත යුතුය.**

මූල්‍ය අරමුදල කිව්වත් නැතත් අප අපේ ආර්ථිකය සකසා ගත යුතුය. මූල්‍ය අරමුදලෙන් අපට ලැබෙන්නේ සහයෝගයක් පමණකි. ඒ නිසා මූල්‍ය අරමුදලට ගිය පමණින් සියල්ල විසඳෙන්නේ නැත. ඔවුන් සමග එකඟ වන දේවල් නොකිරීමෙන් තව තවත් වළේ වැටෙන්නේ අප මිස ඔවුන් නොවේ. මූල්‍ය අරමුදල කියන සීමාවලින් එහාට ගොස් අපේ ආර්ථිකය නිවැරැදි කර ගැනීම අපේ වගකීමකි.

මූල්‍ය අරමුදලට නොගොස් අපේ ආර්ථිකය නිවැරැදි කර ගැනීමේ හැකියාව අපට ද තිබිණි. එහෙත් දැන් අප සිටින්නේ රටට අත්‍යවශ්‍ය ඖෂධ වර්ග ටික ආනයනය කර ගැනීමට අවශ්‍ය ඩොලර් ටිකවත් නැති තත්ත්වයකය. ඒ නිසා දැන් වෙන විකල්පයක් නැත. තිබෙන ණය ප්‍රතිව්‍යුහගත කර ගැනීමට මූල්‍ය අරමුදල අත්‍යවශ්‍යය. අප කාට කොච්චර ණය ද ඒවා ගෙවිය යුත්තේ කොහොමද, කවදද කියා වඩාත් පුළුල් තුලනාත්මක (Debt Sustainability Analysis) විග්‍රහයක් කළ හැක්කේ මූල්‍ය අරමුදලට පමණකි. අනෙක් පැත්තෙන් මූල්‍ය අරමුදල හැර වෙනත් කිසිවකු මේ වෙලාවේ අපට ඩොලර් නොදෙයි. ඒ නිසා දැන් මූල්‍ය අරමුදලට යන්නට සිදුවී තිබේ. එහි ගියත් ඉන් අපට ලැබෙන්නේ ආර්ථිකය ප්‍රතිව්‍යුහගත කර ගැනීමට උදව් පමණි. අපේ ආර්ථික ප්‍රතිසංස්කරණ කරගත යුත්තේ අප විසින්මය.

**ආර්ථිකය ප්‍රතිව්‍යුහගත කිරීම ගැන සේම ආර්ථික සංවර්ධනය ගැන ද ලංකාවේ පවතින්නේ වැරැදි කියවීමකි. පාරවල් හැදීම, ජනතාවට සල්ලි බෙදදීම සංවර්ධනය ලෙස බොහෝ දෙනා සලකති. ආර්ථිකය ප්‍රතිව්‍යුහගත කිරීම කියන්නේ ආර්ථිකයට මැනවින් ධාවනය කිරීමට අවශ්‍ය පසුබිම සැකසීමටය. ඒ සඳහා දෙස් විදෙස් පෞද්ගලික අංශය සම්බන්ධ කරගත යුතුමය.**

**දුප්පත් මිනිසුන්ට සහන සලසන්නැයි කීම මූල්‍ය අරමුදලේ පස් වැනි නිර්දේශයයි. ඔවුන් කියන හැටියට රජය දැන් දුප්පතුන් වෙනුවෙන් වැය කරන්නේ අඩු මුදලකි. දුප්පතුන්ට සහන දෙන බව කියමින් පාන් පිටි, ගෑස්, කිරිපිටි, විදුලිය යනාදියට සහනාධාර නොදී නියම දුප්පතුන් හඳුනාගෙන ඔවුන්ගේ බැංකු ගිණුමකට මුදල් දීමේ ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු බව මූල්‍ය අරමුදලේ යෝජනාවයි.**



ඇඩ්වකාටා ආර්ථික පර්යේෂණායතනයේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරි **ධනනාත් ප්‍රනාන්දු**

සියලු දෙනාට සමාන තරගකාරී බිමක් සැකසීම ප්‍රතිසංස්කරණවල මූලික අරමුණ හා දැක්ම විය යුතුය. තරගයක් ආරම්භ කිරීමට සියලු දෙනාට තිබිය යුත්තේ සමාන අවස්ථාය. දක්ෂතම ව්‍යාපාරිකයන්ට ජයග්‍රහණය කළ හැක්කේ එවිට පමණය. තරගය ආරම්භ කිරීමට කාටත් තිබෙන්නේ එකම ස්ථානයක් නම් කවුරුත් තරගයට පිවිසෙති. ඒ ඒ අයට වෙන වෙන තැන්වලින් තරගය ආරම්භ කළ හැකි වුවහොත් ඒ තරගය තරගකාරී නොවෙයි. බොහෝ දෙනෙක් එවැනි තරගයකට නොපිවිසෙති. සියලු දෙනාට තරග කළ හැකි සමාන බිමක් ගොඩනැඟීම ආර්ථික ප්‍රතිසංස්කරණවල මූලික අරමුණ විය යුත්තේ එහෙයිනි.

**දැන් ලංකා රජය ව්‍යාපාර රැසක් කරයි. ඛනිජ තෙල්, ගෑස්, විදුලිය සේම ගොඩ බිම හා ගුවන් ප්‍රවාහන සේවා ඇතුළු ව්‍යාපාර රැසක රජය නිරත වෙයි. ඒ නිසා ඒ කිසිවක වගකීම කිසිවෙක් නොගනිති. ඒ නිසා මේ රාජ්‍ය ව්‍යාපාරවලට දෙස් විදෙස් පෞද්ගලික අංශය සම්බන්ධ කරගත යුතුමය.**

**රජයකට කළ නොහැකි ව්‍යාපාරවලින් රජය ඉවත් විය යුතුය. ඒ අවස්ථා දිය යුත්තේ පෞද්ගලික අංශයටය.** ඇතැම් ඒවා රාජ්‍ය හා පෞද්ගලික හවුල් ව්‍යාපාර ලෙස පවත්වාගෙන යා හැකිය. ගොඩබිම මගී ප්‍රවාහනය, අධ්‍යාපන හා සෞඛ්‍ය වැනි අත්‍යවශ්‍ය සේවා රාජ්‍ය කළමනාකාරිත්වය යටතේ පැවතීම සහේතුකය. එහෙත් ඒවායේ පවතින අකාර්යක්ෂම හා දූෂිත ක්‍රමවේද සම්පූර්ණයෙන්ම අකා මකා දැමිය යුතුය.

**රජය ව්‍යාපාර නොකළ යුතු බවට හොඳම උදාහරණය ශ්‍රී ලංකන් ගුවන් සේවයයි.** එහි වසරක පාඩුව රුපියල් බිලියන 45ක් පමණ වෙයි. එය සමෘද්ධි ව්‍යාපාරය වෙනුවෙන් කරන වියදමට සමානය. ඉතින් මේ ගමන තවදුරටත් යා හැකිද?

**ඛනිජ තෙල් හා විදුලි වැනි සංස්ථා මණ්ඩලවල පාඩුද කිසිසේත් දරාගත හැකි ඒවා නොවේ. ඒවා පවත්වාගෙන යාමට බදු ගෙවන්නේ රටේ දුප්පත් මිනිසුන්ය.**

මා මේ කියන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියන දේවල් නොවේ. රටක් ලෙස අප කළ යුතු දේවල්ය. රටේ පොදු ජනතාව මත පැටවී තිබෙන බර ලිහිල් කිරීමට කළ යුතු දේවල්ය. වැරැදි පාරක යන රටේ ආර්ථිකය නිවැරැදි මාවතකට ගැනීමට කළ යුතු දෑය.

මූල්‍ය අරමුදල දැනට නිකුත් කර තිබෙන වාර්තාවේ ප්‍රධාන නිර්දේශ පහකි. රාජ්‍ය ආදයම වැඩිකරගත යුතු බව ඔවුන්ගේ පළමු වැනි නිර්දේශයයි. ඒ සඳහා ආදයම් බදු හා වැට් බදු ඉහළ නැංවිය යුතු බව ඔවුහු කියති. පෙට්‍රල්, ඩීසල්, විදුලිය වැනි බලශක්තිවල මිල තීරණය කිරීම සඳහා මිල සූත්‍රයක් හඳුන්වාදිය යුතු බව මූල්‍ය අරමුදල කියයි. එසේම රාජ්‍ය වියදම් අඩු කර ගත යුතු බවද මූල්‍ය අරමුදල පෙන්වා දෙයි.

ණය ස්ථාවර කර ගැනීමට නිශ්චිත ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු බව ඔවුන්ගේ දෙවැනි නිර්දේශයයි. ඉන් අදහස් කරන්නේ ණය ප්‍රතිව්‍යුහගත කර ගැනීම පිළිබඳවය.

**විනිමය අනුපාතය වෙළෙඳපොළ සාධක මත ගෙවන ඉල්ලුම සැපයුම මත තීරණය වන්නට ඉඩ හරින්නැයි කීම ඔවුන්ගේ තෙවැනි නිර්දේශයයි.** එය කළ යුත්තේ බදු හා පොලී අනුපාත වැඩි කිරීම සමග බව මූල්‍ය අරමුදල කියයි.

**උද්ධමනය අවම කිරීම සඳහා පියවර ගත යුතු බව ඔවුන්ගේ හතරවැනි නිර්දේශයයි. මුදල් අච්චු ගැසීම නිසා මහා භාණ්ඩාගාරයේ රැස්වී තිබෙන බැඳුම්කර වෙළෙඳපොළට නිකුත් කර මුදල් ප්‍රමාණය අඩුකර ගත යුතු බව මූල්‍ය අරමුදල පෙන්වා දෙයි.**

**දුප්පත් මිනිසුන්ට සහන සලසන්නැයි කීම මූල්‍ය අරමුදලේ පස් වැනි නිර්දේශයයි. ඔවුන් කියන හැටියට රජය දැන් දුප්පතුන් වෙනුවෙන් වැය කරන්නේ අඩු මුදලකි. දුප්පතුන්ට සහන දෙන බව කියමින් පාන් පිටි, ගෑස්, කිරිපිටි, විදුලිය යනාදියට සහනාධාර නොදී නියම දුප්පතුන් හඳුනාගෙන ඔවුන්ගේ බැංකු ගිණුමකට මුදල් දීමේ ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු බව මූල්‍ය අරමුදලේ යෝජනාවයි.**

## පවතින බදු ක්‍රමය අසාධාරණයි

දුප්පතුන් සියල්ලන්ට සමාන මුදලක් නොදී අපහසුතාවේ මට්ටම අනුව දිය යුතු මුදල වෙනස් විය යුතු බව මූල්‍ය අරමුදල පෙන්වා දෙයි. දුප්පතුන්ට එසේ සහන දිය යුතු බව කියනවා මිස දුප්පතුන් මත තව තවත් බර පැටවෙන ආර්ථික ප්‍රතිසංස්කරණ කළ යුතු බවක් මූල්‍ය අරමුදල නොකියයි.

මූල්‍ය අරමුදල එසේ කිව්වාට රටේ යහපත සඳහා ඊට වඩා ප්‍රතිසංස්කරණ කළ යුතු බව මගේ විශ්වාසයයි. මූල්‍ය අරමුදල කරන ඒ නිර්දේශ පහ ක්‍රියාත්මක කිරීමෙන් පමණක් අපට මේ අර්බුදයෙන් ගොඩට පැමිණිය නොහැකිය. මූල්‍ය අරමුදලේ නිර්දේශ තාවකාලික විසඳුම් පමණකි. අපේ ආර්ථිකයේ ආනයන හා අපනයන අතර ප්‍රශ්න පවතී. එසේම අපේ ආර්ථිකය තරගකාරී ද නැත. ආර්ථිකය තරගකාරීවීමට නම් එයට නිසි පරිදි ධාවනය කළ හැකි පරිසරයක් සැකසිය යුතුය. දැනට එවැනි පරිසරයක් නොපවතී.

**ව්‍යාපාර ලියාපදිංචි කර ගැනීමේදී සහ ව්‍යාපාරවලට ඉඩම් ලබාගැනීමේ දී ආයෝජකයන්ට මුහුණදීමට සිදුවන ප්‍රශ්න ඉතා බරපතළය. එහිදී පවතින බාධා සුවිශාලය. රටේ ඉඩම්වලින් 80%ක්ම අයිති රජයටයි. ඒ ඉඩම් රටේ ජනතාවට, ආයෝජකයන්ට බෙදා දිය යුතුය.** භූමිය, ශ්‍රමය හා ප්‍රාග්ධනය ව්‍යවසායකත්වයේ ත්‍රිවිධ රත්නයයි. ව්‍යාපාරයක ප්‍රධාන මූලික සාධක ඒවාය. දැනට පවතින ඒ බාධක හිරිහැර තුරන් කළ යුතුය. දුම්රිය දෙපාර්තමේන්තුව සතුව වාණිජ ඉඩම් විශාල ප්‍රමාණයක් පවතී. එහෙත් ඒවායෙන් රටටවත් රජයටවත් නිසි ප්‍රතිඵලයක් ආදායමක් නොලැබෙයි.

අපනයන වැඩි කර ගැනීමට ගෝලීය සැපයුම්දාමවලට සම්බන්ධ විය යුතුය. ඒ සඳහා කළ යුතු ප්‍රතිසංස්කරණ ද රැසකි. ඒ සඳහා අපේ ආනයන නිසි පරිදි විය යුතුය.


**ඒ සම්බන්ධ බදු ක්‍රමවත් හා විධිමත් විය යුතුය. දැන් පවතින්නේ එක රැයින් වෙනස් කරන ආයතන බදු ප්‍රතිපත්තියකි. අද තියෙන බද්ද හෙට වෙනස් කරයි. ඒවා එසේ නොවිය යුතුය.** එවැනි පරිසරයක අපනයන වර්ධනය කර ගැනීමට නොහැකිය. එසේ නොවුණොත් අපේ අපනයන වර්ධනය නොවෙයි.

**රජයට කළ නොහැකි හා රජය විසින් නොකළ යුතු ව්‍යාපාර පෞද්ගලික අංශයට බාර දිය යුතු ගමන් රාජ්‍ය සේවයෙහි ද විශාල වෙනස්කම් කළ යුතුය. රාජ්‍ය සේවකයෝ ලක්ෂ 15ක් සිටිති. රටේ මුළු ශ්‍රම බලකායම ලක්ෂ 80කි. ඉන් ලක්ෂ 15ක්ම රජයේ සේවකයෝය. ඒ අතරින් ද වැඩි පිරිස දේශපාලන පත්වීම් ලද පුද්ගලයෝය. ඔවුන්ට වැටුප්, විශ්‍රාම වැටුප් හා වෙනත් වරප්‍රසාද සහ දීමනා ලබාදීමට තරම් ආදායමක් හෝ වත්කම් රජය සතුව නොපවතී. ඒ නිසා රාජ්‍ය සේවය සම්පූර්ණයෙන්ම ප්‍රතිසංවිධානය කළ යුතුමය.**

ඊට අමතරව ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්වාධීනත්වය සුරැකීම සඳහා ද පියවර රැසක් ගත යුතුය. ඒ සඳහා නව නීති රීති හා ක්‍රමවේද සකසාදීම අත්‍යවශ්‍ය කොන්දේසියකි.

**මහ බැංකුවේ කටයුතු ඇමැතිවරයකුගේ පෞද්ගලික දැක්ම මත තීරණය වීම රටට ඉතා හානිකරය. මහ බැංකුවේ ස්වාධීනත්වයට හානි නොවන ප්‍රතිපත්ති රාමුවක් තිබිය යුතුය.** ඒ ප්‍රතිපත්ති රාමුව වහා සකසා ගත යුතුය. එසේම රටේ දැනට පවතින බදු ක්‍රමය අසාධාරණය. අයුක්තිසහගතය. ආදායම් බදු සේම වක්‍ර බදු ද වෙනස් විය යුතුය. ආනයන හා අපනයන බදු රාජ්‍ය ආදායම ඉහළ නැංවීමට ඉවහල් වන අයුරින් වෙනස් කළ යුතුමය. ගැසට් මගින් එක රැයින් බදු වෙනස් කරන ප්‍රතිපත්ති වහාම හකුළාගත යුතුය. එසේම වෙළෙඳපොළේ භාණ්ඩ හා සේවා මිල වෙනස් වන ආකාරය මත තීරණය වන දුප්පතුන්ට සහන සැලසෙන මුදල් සහනාධාර ක්‍රමයක් හඳුන්වා දිය යුතුය. **සහනාධාර දිය යුත්තේ ඒවා අත්‍යවශ්‍ය අයට පමණකි. මෙතෙක් කල් ක්‍රියාත්මක වූ සහනාධාර අනවශ්‍ය අයටත් ලැබිණි. කිරිපිටි හා ගෑස්වලට දුන් සහනාධාර උදාහරණය.** ඒ සහනාධාර ඒවා අනවශ්‍ය ධනපතියන්ට ද ලැබිණි. අනවශ්‍ය අයට සහ නොදිය යුතු අයට සහනාධාර දීම ආර්ථික ප්‍රතිපත්තියක් නොවේ. එය අනාර්ථික ප්‍රතිපත්තියකි.

සාකච්ඡා සටහන - **ගුණසිංහ හේරත්**



### පෝය ලබන ගෙවෙන වේලාවන්

| දිනය | පෝය | පෝය ලබන වේලාව | පෝය ගෙවෙන වේලාව |
|---|---|---|---|
| අප්‍රි:23 | අව අටවක | පෙ.ව.02.25 | 24 දා පෙ.ව.04.29 |
| අප්‍රි:30 | අමාවක | පෙ.ව.00.58 | 01 දා පෙ.ව.01.57 |
| මැයි:08 | පුර අටවක | ප.ව.17.58 | 09 දා ප.ව.18.32 |
| මැයි:15 | පසළොස්වක | ප.ව.12.46 | 16 දා පෙ.ව.09.43 |

# තැන තැන ඇවිළෙන විරෝධය


නිට්ටඹුව


දඹුල්ල


බේරුවල


අම්බලන්ගොඩ


බදුරලිය


වලල්ලාවිට


දෙමෝදර


තංගල්ල


දික්වැල්ල


අනුරාධපුර


නොච්චියාගම


පස්සර



දිගන



වැලිවේරිය


බලපිටිය

ඡායාරූප: ජේ.ඒ.එල්. ජයසිංහ, ගම්පහ තිලකරත්න දිසානායක, ඇල්ල ප්‍රසාද් රුක්මල්, අනුරාධපුර බී.ජී. චතුරංග, මීගහතැන්න ප්‍රේමතිලක පෙරමුණ, වාරණ ආනන්ද ඊ. ජයකොඩි, අලුත්ගම තුසිත ද සිල්වා, දඹුල්ල කාංචන කුමාර ආරියදාස, තංගල්ල ආරියදාස කොඩිතුවක්කු, අම්බලන්ගොඩ සුසිල් ප්‍රියන්ත, නොච්චියාගම පී.ඒ.පී. කුමාර, වලස්ගල නිමල් ප්‍රේමචන්ද්‍ර, ගලහා ඩබ්ලිව්.ඒ. අසේල සහ මීගහතැන්න ප්‍රේමතිලක පෙරමුණ.



# LankaPay Technnovation සම්මාන උළෙලේදී OrelPay ජයග්‍රාහී ලෙස නැගී සිටියි

OrelPay, Industry 4.0 හි ශ්‍රී ලාංකේය බහුජාතික සමාගමක් වන Orel Corporation හි අද්විතීය සහ නව්‍ය ගෙවීම් යෙදුමක් වන අතර, Lanka QR හරහා සිල්ලර ගෙවීම් සඳහා හොඳම ජංගම යෙදුම සඳහා රන් සම්මානය දිනාගත් අතර වඩාත් ජනප්‍රිය ඩිජිටල් ගෙවීම් නිෂ්පාදන කුසලතා සම්මානයෙන්ද 2022 ලංකාපේ ටෙක්නොවේෂන් සම්මාන (LankaPay Technnovation Awards) උළෙලේදී පිදුම් ලැබීය. මෙම උළෙල ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගම විසින් කොළඹ ෂැන්ග්‍රිලා හෝටලයේදී මුදල් ගෙවීමේ තාක්ෂණයේ නවෝත්පාදන සැමරීම සඳහා සංවිධානය කරන ලද අතර, LankaPay Technnovation සම්මාන උළෙලේදී OrelPay සම්මානයට පාත්‍රවූ දෙවන අවස්ථාව මෙය විය.

OrelPay පාරිභෝගිකයාට නව්‍යතම ඩිජිටල් ගෙවීම් විසඳුමක් සැපයීම සඳහා Orel Corporation විසින් හඳුන්වා දුන් යෙදුමකි. (ඇප් එකකි). ශ්‍රී ලංකාවේ අනෙකුත් ගෙවීම් යෙදුම් සමඟ සසඳන විට, OrelPay සුවිශේෂී විශේෂාංග කිහිපයක් හඳුන්වාදෙයි. OrelPay යෙදුමේ සම්පූර්ණ ක්‍රියාකාරිත්වය භුක්ති විඳීමට නව බැංකු ගිණුම් විවෘත කිරීම අවශ්‍ය නොවන අතර පරිශීලකයින්ට Visa සහ MasterCard යටතේ පවතින ඕනෑම ණය හෝ හර කාඩ්පතක් මෙන්ම ශ්‍රී ලංකාවේ බැංකු ගිණුමක් මෙයට සම්බන්ධ කළ හැකිය. තවද, ඕනෑම නව පරිශීලකයෙකුට OrelPay සමඟ කිසියම් ස්ථානයකට පැමිණීමකින් තොරව හෝ ක්ෂණික ඇමතුම් අංකයක් සම්බන්ධ කර ගැනීමකින් තොරව, ඕනෑම තැනක සිට පහසුවෙන් සහ ඉක්මනින් යෙදුම සමඟ ලියාපදිංචි වියහැක. OrelPay පරිශීලකයින්ට උපයෝගිතා බිල්පත්, දුරකථන බිල්පත්, උපකාරක පන්ති ගාස්තු, පරිත්‍යාග සහ තවත් බොහෝ විවිධ ආකාරයේ ගෙවීම් කිරීමට ඉඩ සලසයි.

OrelPay යෙදුමේ ලැයිස්තුගත කර ඇති ගෙවීම් කිරීමට අමතරව, වැඩි වැඩියෙන් ජනප්‍රිය වෙමින් පවතින ලංකා ක්ලියර් හි පොදු ගෙවීම් වේදිකාවක් වන, ඕනෑම LankaQR කේතයක් හරහාද OrelPay භාවිතයෙන් ගෙවීම් සිදුකළ හැක. අධිවේගී මාර්ග ගාස්තු ඇතුළුව විවිධ ගෙවීම් සඳහා මෙයින් පරිශීලකයින්ට හැකියාව මැනවින් ලබා දෙයි. මෙම ගෙවීම් ක්‍රමය වඩාත් ප්‍රයෝජනවත් කරමින්, OrelPay හරහා ස්ථානීය QR කේත පරිලෝකනය කිරීමෙන් ගෙවීම් සිදු කිරීමට අමතරව (WhatsApp වැනි ක්‍රම භාවිත කරමින්) වෙනත් ස්ථානයක සිටින ගෙවීම් ලබන්නෙකු විසින් එවන QR කේතවල රූප ස්කෑන් කර ගෙවීම් සිදු කිරීමටද හැක.

> OrelPay පාරිභෝගිකයාට නව්‍යතම ඩිජිටල් ගෙවීම් විසඳුමක් සැපයීම සඳහා Orel Corporation විසින් හඳුන්වා දුන් යෙදුමකි. (ඇප් එකකි). ශ්‍රී ලංකාවේ අනෙකුත් ගෙවීම් යෙදුම් සමඟ සසඳන විට, OrelPay සුවිශේෂී විශේෂාංග කිහිපයක් හඳුන්වාදෙයි. OrelPay යෙදුමේ සම්පූර්ණ ක්‍රියාකාරිත්වය භුක්ති විඳීමට නව බැංකු ගිණුම් විවෘත කිරීම අවශ්‍ය නොවන අතර පරිශීලකයින්ට Visa සහ MasterCard යටතේ පවතින ඕනෑම ණය හෝ හර කාඩ්පතක් මෙන්ම ශ්‍රී ලංකාවේ බැංකු ගිණුමක් මෙයට සම්බන්ධ කළ හැකිය.

අනෙකුත් සුවිශේෂී විශේෂාංග අතර, Orel Unmanned Store සහ Orange Bot වැනි Orel Corporation විසින් පිරිනමනු ලබන සුවිශේෂී සේවාවන් සඳහා OrelPay ප්‍රවේශය ලබා දෙයි. Orel Unmanned Store යනු 24/7 ප්‍රවේශ විය හැකි සම්පූර්ණ ස්වයංක්‍රීය වෙළඳසැලකි (convenient store). පාරිභෝගිකයින්ට ඔවුන්ගේ OrelPay යෙදුම පිවිසුමේදී පරිලෝකනය කිරීමෙන් වෙළඳසැලට ඇතුළුවිය හැකි අතර ඔවුන්ට OrelPay යෙදුම භාවිතයෙන් නිෂ්පාදන ස්වයං-පරීක්ෂා කර මිලදී ගත හැක. එලෙසම, Orange Bot යනු ඉල්ලුම මත නැවුම් දොඩම් මිරිකා දොඩම් යුෂ නිපදවන සම්පූර්ණ ස්වයංක්‍රීය දොඩම් යුෂ නිකුත් කරන යන්ත්‍රයකි. පාරිභෝගිකයින් Orange Bot යන්ත්‍රය වෙත ගොස් OrelPay යෙදුම හරහා ඇණවුම් සහ ගෙවීම කරයි.

2022 LankaPay Technnovation Awards හිදී OrelPay හි ජයග්‍රහණ පිළිබඳව අදහස් දක්වමින් Orel Corporation හි ව්‍යාපාර සංවර්ධන සාමාන්‍යාධිකාරී චමින්ද ද සිල්වා මහතා පැවසුවේ, "මෙම සම්මාන දෙක දිනා ගැනීම අපගේ කණ්ඩායමට ආඩම්බරයක් වන අතර එය OrelPay හි විශිෂ්ටත්වය මනාව පෙන්නුම් කරයි. Orel Corporation හි නවෝත්පාදන ගුණය අනුව යමින්, ශ්‍රී ලංකාවේ ඕනෑම බැංකු ගිණුමක් හෝ ක්‍රෙඩිට් හෝ ඩෙබිට් කාඩ්පතක් ඇති පාරිභෝගිකයින් සඳහා පහසු සහ සුරක්ෂිත ගෙවීම් පහසුකම් සැලසීමට අපි OrelPay දියත් කළෙමු.

අප විසින් පාරිභෝගිකයාට අතිවිශිෂ්ට අත්දැකීමක් ලබා දීම සඳහා මෙම යෙදුමට අද්විතීය විශේෂාංග සමූහයක් ඒකාබද්ධ කර ඇති අතර, යෙදුමේ උපයෝගීතාව උපරිම අන්දමින් ලබා දී ඇත්තෙමු. වඩාත්ම කැපී පෙනෙන අංගය වනුයේ LankaQR වේදිකාව සමඟ ඇති දැඩි අනුකූලතාවයයි. මෙම ගැළපුම හරහා LankaQR කේතයක් ඇති ඕනෑම කෙනෙකුට කොහේ සිටියත් ඔවුන්ට පරිශීලකයාගේ පවතින බැංකු ගිණුම්, ක්‍රෙඩිට් කාඩ්පත් හෝ ඩෙබිට් කාඩ්පත් භාවිත කර සුරක්ෂිතව ගෙවීම් සිදුකිරීමට හැකියාව පරිශීලකයන්ට ලබා දී ඇත."

එය දියත් කළ දා සිට, OrelPay ශ්‍රී ලංකාවේ ගෙවීම් යෙදුම් අතර කැපී පෙනෙන්නෙකු බවට පත්වීම සඳහා අඛණ්ඩ වැඩිදියුණු කිරීමේ ගමනක් පැමිණ තිබේ. අඛණ්ඩව පවතින නවෝත්පාදනයන් තුළ ඉදිරියට යමින්, පාරිභෝගිකයාට ආරක්ෂිත, විශ්වාසදායක, වඩාත් පහසු ගෙවීමේ විසඳුමක් ලබා දෙමින් OrelPay නව තලයන්ට පිවිසීමට අපේක්ෂා කරයි.



වමේ සිට: LankaClear හි සභාපති ආචාර්ය කෙනත් ද සිල්වා, CBSL සහකාර අධිපති ධර්මසිරි කුමාරතුංග, සාමාන්‍යාධිකාරී - ව්‍යාපාර සංවර්ධන Orel Corporation හි චමින්ද ද සිල්වා, සාමාන්‍යාධිකාරී / LankaClear හි ප්‍රධාන විධායක නිලධාරී චන්න ද සිල්වා



